JMC vLearning
"your virtual learning partner"

# විගණනය භාර ගැනීමේ කොන්දේසි (SLAuS 210)

## AAT අදියර III

FCA - මූල්‍ය පාලනයන් හා විගණනය

ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## විගණනයක් භාරගැනීමේ කොන්දේසි සමග එකග වීම
## (S.L.Au.S 210)

- හැදින්වීම
- සේවය භාරගැනීමේ ලිපියක් යනු
- සේවය භාරගැනීමේ ලිපියක අඩංගු කරුණු
- පුනරාවර්තන විගණනයන්

## හැදින්වීම

ප්‍රායෝගිකව විගණනයක් සිදු කිරීමේදී විගණකවරයාට ආරාධනා කළ පමණින්ම විගණකවරයා අදාළ ව්‍යාපාරයේ විගණනය භාර නොගනී. මෙහිදී ප්‍රථමයෙන්ම විගණනයක් ආරම්භ කිරීමට ප්‍රථම විගණනයට අදාළ කරුණු හා කොන්දේසි පිළිබඳව විගණක හා සේවාදායකයා අතර වාචික එකගතාවයක් ඇති වේ.එසේ ඇති වන වාචික එකඟතාවය ලිඛිත එකඟතාවයක් බවට පරිවර්තනය කිරීමෙන් අනතුරුව හා දෙපාර්ශවයටම අත්සන් කිරීමෙන් පසු/ එකඟ වීමෙන් පසු අනතුරුව විගණනයක් ආරම්භ වේ.

↓

අදාළ සේවාදායකයා විසින් විගණකවරයාට ආරාධනා කිරීම.

↓

එම විගණනයට අදාළ කරුණු හා කොන්දේසි පිළිබදව විගණක හා සේවාදායකයා අතර වාචික එකගතාවයක් ඇති වීම

↓

එසේ වාචිකව එකඟ වන කරුණු ලිපියක් හෝ ගිවිසුමක් මාර්ගයෙන් ලිඛිත එකඟතාවයක් බවට පරිවර්තනය කර දෙපාර්ශවය අත්සන් කිරීම

## සේවය භාරගැනීමේ ලිපියක් යනු

කිසියම් විගණන කාර්යභාරයකට අදාළව විගණක හා සේවාදායකයා අතර ඇතිවන වාචික එකගතාවයන් ලිඛිත එකගතාවයක් බවට පරිවර්තනය කරමින් විගණක විසින් පිළියෙල කර සේවාදායකයා වෙත යවන ලිපිය/ගිවිසුම සේවය භාර ගැනීමේ ලිපිය ලෙස හදුන්වයි.

JMC vLearning
your virtual learning partner

# සේවය භාරගැනීමේ ලිපියක අඩංගු කරුණු

## A) ප්‍රධාන වශයෙන් ඇතුලත් කරන කරුණු

1) විගණනයේ අරමුණු

2) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කළමනාකාරිත්වයේ වගකීම

3) විෂය පතය

4) ඉදිරිපත් කරන ලබන වාර්තාවේ ස්වරූපය හා සේවය යෙදවීමෙන් පැන නගින අනෙකුත් සන්නිවේදන වල ස්වභාවය

5) විගණනය සම්බන්ධයෙන් අදාළවන ඕනෑම අන්දමක වාර්තාවක් ලියකියවිලි හා තොරතුරු වලට සීමාවක් රහිතව ප්‍රවේශ වීමට ඇති අයිතිය

6) ගිණුම් කරණය හා අභ්‍යන්තර පාලන පද්ධතීන්වල ඇති ආවේණික සීමාවන් හා නියැදි පරීක්ෂණ ස්වරූපය මත හෙළිදරව් වී නොමැති සාවද්‍යතා පැවතිය හැකි බව

## B) විගණකගේ කැමැත්ත මත ඇතුලත් විය යුතු කරණු

7) විගණනය සැලසුම් කිරීමට අදාළ වන කරුණු

8) විගණනය සම්බන්ධයෙන් ලබා ගන්නා නියෝජනයක් අලලා කළමනාකාරිත්වයෙන් ලිඛිත තහවුරු කිරීම්

9) විගණක විසින් සේවා දායකයාට නිකුත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් ලිපියක් හෝ වාර්තා වල විස්තරයක්

10) විගණන ගාස්තු තීරණය කිරීමේ පදනම

11) සේවය භාර ගැනීමේ ලිපියක් ලද බව දැන්වීම විගණන කාර්යට අදාළ කොන්දේසීවලට එකඟ වූ බව තහවුරු කරන ලෙස සේවාදායකයාගෙන් කරන ඉල්ලීමක්

## C) අවස්ථානුරූපි කරුණු

12) විගණකගේ ඇතැම් අංගයන් සඳහා විශේෂඥයන්ගේ හා වෙනත් විගණකවරුන්ගේ සේවාව ලබා ගැනීම පිළිබඳව කරුණු

13) අභ්‍යන්තර විගණකයින්ගේ හා සේවාදායකයාගේ අනෙකුත් කාර්ය මණ්ඩලයේ සේවාව ලබාගැනීම පිළිබඳව කරුණු

14) විගණකගේ වගකීමේ සීමාකිරීම් ඇතොත් ඒවා පිළිබඳ කරුණු

15) විගණක හා සේවා දායකයන් අතර ඇතිවන වෙනත් එකඟතාවයන්

JMC vLearning
your virtual learning partner

# පුනරාවර්තන විගණනය

කිසියම් ව්‍යාපාර ආයතනයක් ව්‍යාපාර ඒකකයක් වසර කිපයක් එකම විගණකවරයෙකු විගණක ආයතනයක් විගණනය සිදු කරයි නම්, එය පුනරාවර්තන විගණනයක් ලෙස හැඳින්වේ.

සෑම කාළපරිච්ඡේදයක් සඳහාම නව සේවය භාර ගැනීමේ ලිපියක් නොයැවීමට විගණක තීරණය කළ හැක.

- පසුගිය වසරට සාපේක්ෂව ව්‍යාපාරයේ කළමනාකාරිත්වය සහ අයිතිය වෙනස් වීම
- විගණකගේ අරමුණ හා විෂයපතය පිළිබඳව සේවාදායකයා වැරදි වැටහීමක් ඇති කරගෙන තිබීම
- පසුගිය වසරේ යවන ලද ලිපියේ වෙනස්කම් සිදු කළ විට
- නීතිමය අවශ්‍යතාවයක් වෙනස් වීම
- සේවාදායකයාගේ ව්‍යාපාරයේ ප්‍රමාණය හා ස්වභාවයේ සිදුවන වෙනස්කම්

යෝග්‍ය වේ

JMC vLearning
"your virtual learning partner"